**අභ්‍යන්තර විභාග නිවේදනයයි**

මගේ අංකය: **PPSC/EX/4/1/5/2024(I)**
වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
පළාත් සභා කාර්යාල සංකීර්ණය,
කුරුණෑගල.
2024.02.12

ප්‍රධාන ලේකම් (වයඹ),
ආණ්ඩුකාරවර ලේකම් (වයඹ),
සභා ලේකම් (වයඹ),
වයඹ පළාතේ සියළුම අමාත්‍යාංශ ලේකම් වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ ආයතන ප්‍රධානීන් වෙත.

**වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ සංවර්ධන නිලධාරී සේවයේ සංවර්ධන නිලධාරි III වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය- 2019 (II) 2024**

වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ සංවර්ධන නිලධාරී සේවයේ සංවර්ධන නිලධාරි I ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන තෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය **2024 මාර්තු** මාසය තුළ කුරුණෑගලදී පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ. ඒ අනුව සංවර්ධන නිලධාරී I ශ්‍රේණියේ නිලධාරීන්ට මෙම කාර්යක්ෂමතා කඩඉම් විභාගය සඳහා අයදුම් කළ හැක.

02. මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව අපේක්ෂකයින් ස්වකීය අයදුම්පත්‍ර පිළියෙල කරගත යුතු අතර, නිවැරදිව හා පැහැදිලිව පිළියෙල කළ අයදුම්පත්‍ර තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් **2024.02.29** දින හෝ එදිනට පෙර **"ලේකම්, වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව, බී දොරටුව, පළාත් සභා කාර්යාල සංකීර්ණය, කුරුණෑගල"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් ඉදිරිපත් කරන ලියුම් කවරයේ වම් පස ඉහළ කෙලවරේ විභාගයේ නම සඳහන් කළ යුතුය. අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමට සිදුවනු ඇත.

03. **සුදුසුකම්:-** සංවර්ධන නිලධාරී සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන් මෙම විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් ලබයි

04. **විභාග ගාස්තු:-** පළමුවරට මෙම විභාගයට අයදුම්කිරිමට කිසිදු විභාග ගාස්තුවක් ගෙවිය යුතු නොවේ. එසේ වුවත් ඉන් පසු වාර වලදී නිලධාරීන් විසින් විභාගය සඳහා අයදුම් කරන්නේ නම් රු 300/= ක් විභාග ගාස්තු වශයෙන් වයඹ පළාත් සභාවේ අංක 2003-02-13 දරණ ආදායම් ශීර්ෂයට බැර වන පරිදි වයඹ පළාතේ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ගෙවා ව.ප.ස.මු.02 ආකෘතියෙන් ලබාගත් රිසිට්පත අයදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ ඇලවිය යුතුය. මෙම විභාගය සඳහා ගෙවනු ලබන ගාස්තුව වෙනත් කිසිදු විභාගයකට මාරු කිරීමට ඉඩ දෙනු නොලැබේ. කුවිතාන්සියේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

05. **අනන්‍යතාව :-** විභාග අපේක්ෂකයින් විභාග ශාලාව තුලදී තමන් පෙනී සිටින සෑම විෂයයක් පාසාම විභාග ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාවය ඔප්පු කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන ලියවිලි අතුරින් කවරක් වුවද පිළිගත හැකිය.

I. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ කොමසාරිස් විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත
II. වලංගු විදේශ ගමන් බලපත්‍රය (පාස්පෝට් බලපත්‍රයක් )
III. වලංගු රියදුරු බලපත්‍රය

06. **විභාග ප්‍රවේශපත්‍ර** :- විභාග නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් අයදුම්කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තු ගෙවා ඊට අදාළ ලදුපත සමග නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් ඉදිරිපත් කර ඇති අයදුම්කරුවන් සඳහා, මාර්ගගත ක්‍රමය (online) යටතේ විභාග ප්‍රවේශපත්‍රය යොමු කරනු ලැබේ.

**විභාගය පැවැත්වෙන දිනට දින 03 කට පෙර ප්‍රවේශපත්‍ර නොලැබුණිනම් ඒ බව වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ විභාග අංශයෙන් විමසිය යුතුය.**

එලෙස අයදුම්කරුවන් වෙත විභාග ප්‍රවේශපත්‍ර යොමු කළ වහාම ඒ බව වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්යාලීය වෙබ් අඩවියේ (www.psc.nw.gov.lk) පළකරන අතර, ඒ බව අදාළ දෙපාර්තමේන්තු වෙතද ලිඛිතව දැනුම් දෙනු ලැබේ. දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් අදාළ අයදුම්කරුවන් ඒ පිළිබඳව දැනුවත් කළ යුතුය.

07. විභාගයට පෙනී සිටින නිලධාරීන් විසින් විභාග ශාලාධිපති වෙත ඔවුන්ගේ අත්සන සහතික කරවාගත් ප්‍රවේශපත්‍ර ඉදිරිපත් කළ යුතුය. විභාගය සඳහා ප්‍රවේශපත්‍ර ලැබූ, පළමු වතාවට විභාගයට පෙනී සිටින නිලධාරීන්ට විභාගයට පෙනී සිටීමට හැකි වන පරිදි දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් රාජකාරි නිවාඩු ලබා දිය යුතු අතර, ගමන් ගාස්තු නොගෙවිය යුතුය.

08. අපේක්ෂකයින් අදාල සේවයට ඇතුලත්වීම සඳහා වූ විභාගයට පෙනී සිටි භාෂා මාධ්‍යයෙන් හෝ රාජ්‍ය භාෂාවකින් ප්‍රශ්නපත්‍ර වලට පිළිතුරු සැපයිය යුතුය.

**09.විභාග පටිපාටිය :-**

මෙම පරීක්ෂණය පහත සඳහන් විෂයන් සම්බන්ධයෙන් සැකසෙන ලිඛිත ප්‍රශ්න පත්‍රයකින් සමන්විත වේ. එම පරීක්ෂණය සඳහා උපරිම ලකුණු 100 කි. සමත් වීම සඳහා පරීක්ෂණයෙන් ලකුණු 40% හෝ ඊට වැඩි ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතුය.

| | විෂයය | කාලය | උපරිම ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|---|
| 01. | ව්‍යාපෘති කළමනාකරණය | පැය 03 යි | 100 | 40% |

**<u>විෂය නිර්දේශය:-</u>**

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| ව්‍යාපෘති කළමනාකරණය | I. ව්‍යාපෘතියක් යන්න නිර්වචනය කිරීම<br>II. ව්‍යාපෘති කළමනාකරණය<br>III. ව්‍යාපෘති චක්‍රය<br>IV. ව්‍යාපෘති පිළියෙල කිරීම සහ විග්‍රහ කිරීම<br>V. ව්‍යාපෘති ඇගයීම<br>පිළිගෙවුම් කාලය<br>ශුද්ධ වර්තමාන වටිනාකම<br>අභ්‍යන්තර ප්‍රතිලාභ අනුපාතය<br>පිරිවැය ප්‍රතිලාභ අනුපාතය<br>වාර්ෂික සාමාන්‍ය ඉපැයුම් අනුපාතය<br>VI. ව්‍යාපෘති සංවිධානය<br>VII. ණයා මිල යොදාගැනීම |

10. මෙම විභාග නිවේදනයේ විධි විධාන සලසා නොමැති කවර කරුණක් පිළිබඳ වුවද වයඹ පළාත් ගරු ආණ්ඩුකාරතුමාගෙන් විමසීමෙන් අනතුරුව වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

**ඊ. එම්.පී. ඒකනායක,**
ලේකම්,
වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

ආදර්ශ අයදුම්පත්‍රය

| |
|---|
| |

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි

**<u>වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ සංවර්ධන නිලධාරී සේවයේ සංවර්ධන නිලධාරි III වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය- 2019 (II) 2024</u>**

01. 1.1 මුලකුරු සමඟ නම (සිංහලෙන්):- ..........................................................................................
............................................................................................................මයා/මිය/මෙනවිය

1.2 මුලකුරු සමඟ නම (ඉංග්‍රීසියෙන්) Mr. /Mrs. /Miss.............................................................
.........................................................................................................................................

1.3 මුලකුරු වලින් හැඳින්වෙන නම (සිංහලෙන්): .................................................................
.........................................................................................................................................

1.4 විද්‍යුත් තැපැල් ලිපිනය (E-mail) :- ...............................................................................
……………………………………………………………………………………..

**(විද්‍යුත් තැපැල් ලිපිනයට විභාග ප්‍රවේශ පත්‍රය යොමු කරන බැවින් එය නිවැරදිව සඳහන් කිරීම අනිවාර්යය වේ.)**

1.5 ජාතික හැඳුනුම්පත් අංකය:-

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |

1.6 උපන් දිනය:-අවුරුද්ද

| | | | |
|---|---|---|---|
| | | | |

| | |
|---|---|
| | |

| | |
|---|---|
| | |

02. සේවා ස්ථානය හා ලිපිනය

2.1 කාර්යාලයේ / දෙපාර්තමේන්තුවේ / ආයතනයේ නම:- ................................................
.........................................................................................................................................

2.2 රාජකාරි ලිපිනය:- ..........................................................................................................
.........................................................................................................................................

2.3 දුරකතන අංකය :- රාජකාරී : ..............................................
පෞද්ගලික : ..............................................

03. දැනට දරණ තනතුර:-

3.1 තනතුර :.........................................................
3.2 පන්තිය : .......................................................
3.3 ඉහත පන්තියට පත්වූ දිනය :....................................

04. ඔබ විභාගයට ඉදිරිපත් වන භාෂා මාධ්‍යය:-

| |
|---|
| |

(සිංහල - S , දෙමළ - T , ඉංග්‍රීසි - E )
(අදාල අක්ෂරය කොටුව තුල ලියන්න)

05. ඔබ විභාගයට ඉල්ලුම්කරන විෂය:- (ප්‍රශ්න පත්‍රයේ නම සඳහන් කරන්න.)

I. .............................................................................

06. ඔබ විභාගයට පෙනී සිටින්නේ පළමු වතාවටද ? ..........................................

6.1 එසේ නොවන්නේ නම් විභාග ගාස්තු ගෙවා ලබාගත් (අලවා ඇති) කුවිතාන්සියේ,

කුවිතාන්සි අංකය:- ........................................... මුදල:- .....................................

දිනය:- .......................................................

නිකුත් කල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය:- .................................................................

| කුවිතාන්සිය නොගැලවෙන සේ මෙහි අලවන්න. |
|---|

07. අයදුම්කරුගේ සහතිකය:-

ඉහත සඳහන් විස්තර නිවැරදි බවත්, ඉහත 4 ඡේදයේ දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් විභාගයට පෙනී සිටීමට මට හිමිකම් ඇති බවත් ප්‍රකාශ කරමි. මෙම විභාගය සඳහා පනවා ඇති නීති පිළිපැදීමටද එකඟ වන අතර, මා වයඹ පළාත් සහා රාජ්‍ය සේවයේ නිලධාරියෙකු / නිලධාරිනියක බවද සහතික කරමි.

........................................................

අයදුම්කරුගේ අත්සන

දිනය:- .....................................

08. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය

I. ඉහත විස්තර සඳහන් ……………………......……………….............…… නැමැති මෙම නිලධාරියා/නිලධාරිනිය මෙම දෙපාර්තමේන්තුවේ සේවයේ නියුක්තව සිටින වයඹ පළාත් සහා රාජ්‍ය සේවයේ නිලධාරියෙකු/ නිලධාරිනියක බවද,

II. ඔහු/ඇය සංවර්ධන නිලධාරී ............................... ශ්‍රේණියේ නිලධාරියෙකු/ නිලධාරිනියක බවද,

III. ඉහත සපයා ඇති තොරතුරු නිවැරදි බවද,

IV. මෙම විභාගයට පෙනී සිටින්නේ පළමු වතාවට බවද/ පළමු වතාවට නොවන බවද, නියමිත පරිදි විභාග ගාස්තු ගෙවා ඇති බවද,

V. අයදුම්කර ඇති භාෂා මාධ්‍යයෙන් විභාගයට පෙනී සිටීමට හිමිකම ඇති බවද, සහතික කරමි.

(අදාල නොවන වචන කපා හරින්න)

………………...……………………

ආයතන /පළාත් දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ

අත්සන හා නිල මුද්‍රාව

පදවි නාමය :…………………………………………………….

ලිපිනය :…………………………………………………....

දිනය :…………………………………………………….